# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020
# General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

දේශපාලන විද්‍යාව I
Political Science I

23 S I

කාලය : පැය දෙකයි
Time : Two hours

උපදෙස් :
- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20කින් යුක්ත වේ.
- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුය.
- එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100කි.

## A කොටස

- **ප්‍රශ්න අංක 01-20 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර හෝ ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. **දේශපාලනය හඳුනාගැනීමේ දී වැදගත් කරුණක් වන්නේ,**
   (1) සමාජ ජීවිතයේ ප්‍රධාන පැතිකඩක් නොවීම (2) පුළුල් අර්ථ දක්වන සංකල්පයක් නොවීම
   (3) දේශපාලන ශාස්ත්‍රය හැදෑරීමට දීර්ඝ ඉතිහාසයක් නොවීම
   (4) ඇරිස්ටෝටල් හා ප්ලේටෝ දේශපාලනය හරසුන් ලෙස නොදැකීම.
   (5) දේශපාලනය හැදෑරීම යන්න මනඃකල්පිත වීම (.........)

2. **දේශපාලනය කිරීම යන්නට අයත් වන්නේ,**
   (1) ආණ්ඩු බලය ප්‍රතික්ෂේප කිරීම. (2) ආණ්ඩුබලය අර්ථ ශුන්‍ය ලෙස සැලකීම
   (3) මැතිවරණ වර්ජනය (4) දේශපාලන පක්ෂවල ක්‍රියාකාරිත්වය මර්ධනය.
   (5) සටන් හා විරෝධතා ව්‍යාපාරවලට සහභාගී වීම (.........)

3. **චර්යාවාදයේ මෑතකාලීන ප්‍රවණතාවක් වන්නේ,**
   (1) පුරවැසියන්ගේ දේශපාලන සහභාගීත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම.
   (2) ඇමරිකානු චර්යාවාදය වර්තමානයේ බිඳවැටී ඇත.
   (3) 1970 දශකවල එහි උපරිම අවස්ථාව නියෝජනය කළේය.
   (4) දේශපාලන චර්යාව පමණක් අධ්‍යයනය නොකරයි
   (5) ඉහත සියල්ලම (.........)

4. **දේශපාලන මතවාද සම්බන්දයෙන් අදාලවන ප්‍රකාශය වන්නේ,**
   (1) සමාජයේ දේශපාලනයට බලපෑම් නොකරයි (2) දේශපාලන ක්‍රියාකාරිත්වයට මඟ නොපෙන්වයි
   (3) සමාජයේ විශාල ජන කොටසක් ආකර්ශනය නොකරයි.
   (4) එකිනෙකට සංගත අදහස් මාලාවකින් සමන්විත වෙයි.
   (5) සමාජයේ යම් යම් කොටස්වල දේශපාලන විඥානය, විශ්වාස හා ඉදිරි දැක්ම හැඩගස්වයි (.........)

5. **දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් අදාල ප්‍රකාශය වන්නේ,**
   (1) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ නැතිවම බැරි අංගයකි.
   (2) දේශපාලන පක්ෂ දීර්ඝ ඉතිහාසයට හිමිකම් කියයි
   (3) යුරෝපයේ හා ඇමරිකාවේ දේශපාලන පක්ෂ බිහිවුයේ 19 වන සියවසේ මැද භාගයේ නොවේ.
   (4) ලංකාව ඉන්දියාව වැනි රටවල විසිවන සියවසේ දි දේශපාලනය දුර්වල විය
   (5) මැතිවරණ හෝ වෙනත් මාධ්‍යන් මඟින් ආණ්ඩු බලය ලබා ගැනීම අරමුණු කරගෙන ගොඩනගා ඇති සංවිධානයකි (.........)

6. **තුලනාත්මක දේශපාලනය සම්බන්ධයෙන් අදාල වන්නේ,**
   (1) 1950 දශකයෙන් පසු දේශපාලන විද්‍යාවේ නිශ්චිත ධාරාවක් ලෙස තුලනාත්මක දේශපාලනයේ වර්ධනය සිදුවිය.
   (2) ඇමරිකානු දේශපාලන විද්‍යාව තුළින් දුර්වල විය.
   (3) මෙය හැදෑරීමේ ඉතිහාසය සොක්‍රටීස්ගෙන් ආරම්භ වෙයි.
   (4) මැකියාවෙල්ලි ද තම දේශපාලන අධ්‍යනය සඳහා තුලනාත්මක ප්‍රවේශයන් භාවිතා කළේය
   (5) වර්තමානයේ අභියෝගයට ලක්වී ඇත. (.........)

7. **රාජ්‍ය සම්බන්ධයෙන් අදාල ප්‍රකාශය නොවන්නේ,**
   (1) රාජ්‍ය යනු ඓතිහාසික හා සමාජීය ප්‍රපංචයක් වීම.
   (2) රාජ්‍ය දේශපාලන විද්‍යාවේ ප්‍රධාන පෙළේ තේමාවක් වීම.
   (3) අප සැමගේ ජීවිතයට සෘජුව හෝ වක්‍රව බලපායි .
   (4) රාජ්‍යයේ බලපෑමට හසු නොවී ජීවත්විය නොහැකිය.
   (5) රාජ්‍යයට නිශ්චිත භූමිකාවක් නොපවතී. (.........)

8. **නූතන ජාතික රාජ්‍ය සම්බන්ධයෙන් අදාල වන්නේ,**
   (1) ජාතික රාජ්‍ය යන අදහස ප්‍රථමයෙන්ම වර්ධනය වූයේ 18 වන සියවසේ යුරෝපයේය.
   (2) "මෙහි මූලික ඇඟවීම එක ජාතියකට එක් රාජ්‍යයකි.එක රාජ්‍යයකට සිටින්නේ එක ජාතියකි" යන්නයි
   (3) 1789 ප්‍රංශ විප්ලවයෙන් පසු ජාතික රාජ්‍ය අභාගයට ගියේය. .
   (4) පූර්ව නූතන රාජ්‍ය ජාතික රාජ්‍ය විය.
   (5) පූර්ව නූතන රාජ්‍යවලට නිශ්චිත භූමි ප්‍රදේශ හා නිශ්චිත දේශ සීමා තිබුනි. (.........)

9. **රාජ්‍ය හා ස්වාධිපත්‍ය සම්බන්ධයෙන් අදාල වන්නේ,**
   (1) ස්වාධිපත්‍ය සංකල්පය ප්‍රථම වරට දේශපාලන විද්‍යා සාහිත්‍යට හඳුන්වාදෙනු ලැබුයේ ජෝන් ඔස්ටින්ය.
   (2) ස්වාධිපතිධාරා සංස්ථාව ආණ්ඩුවට යටත්ය.
   (3) අභ්‍යන්තර ස්වාධිපත්‍යයෙන් බාහිර ස්වාධිපත්‍ය ආවරණය වෙයි. .
   (4) ස්වාධිපත්‍ය බලය අඳවන විට ගෝලියකරණයෙන් අභියෝගයට ලක්වී ඇත.
   (5) ප්‍රබල රාජ්‍යන්හි ස්වාධිපත්‍ය දුබල රාජ්‍යන්හි ස්වාධිපත්‍යට අභියෝගයක්ව පවතී (.........)

10. **ස්ත්‍රීවාදය සම්බන්ධයෙන් අදාල වන්නේ,**
   (1) රාජ්‍ය සම්බන්ධයෙන් විශේෂ ස්ත්‍රීවාදී න්‍යායක් නැත.
   (2) බලය පිළිබඳ න්‍යායක් ද ස්ත්‍රීවාදයට නැත.
   (3) ස්ත්‍රීවාදය විසින් පුරුෂ ආධිපත්‍ය ප්‍රශ්න කරනු නොලබන අතර එය පිලිගනී.
   (4) රාජ්‍ය පුරුෂ මූලික මෙවලමකි යන්න ස්ත්‍රී වාදයේ විවේචනයට ලක්වෙයි
   (5) ස්ත්‍රීවාදය විසින් ලිබරල්වාදය හා මාක්ස්වාදය විවේචනය කරයි. (.........)

11. **ඒකීය ආණ්ඩුක්‍රම සම්බන්ධයෙන් අදාල නොවන්නේ,**
   (1) මධ්‍යම ආණ්ඩුවේ බලය දුර්වල කරයි.
   (2) ව්‍යවස්ථාවේ උත්තරීතරත්වය මධ්‍යයට පවරා ඇත.
   (3) පර්යන්ත ආණ්ඩු මධ්‍යම ආණ්ඩුවට යටත්ය.
   (4) පළාත් ආණ්ඩු පාලනයට මධ්‍යම ආණ්ඩුවට බලය ඇත.
   (5) බලය විතැන්වීම ඒකීය ක්‍රමයේ ප්‍රවණතාවයක් නොවේ. (.........)

12. **ජනාධිපති ආණ්ඩුක්‍රමයට අදාල වන්නේ,**
   (1) විධායකය හා ව්‍යවස්ථාදායකය වෙන වෙනම තෝරාගනී.
   (2) විධායකයට හා ව්‍යවස්ථාධායකයට වෙන වෙනම ස්වාධින බලතල හිමි නොවේ.
   (3) විධායකය ව්‍යවස්ථාදායකයට වග කියයි.
   (4) කැබිනට් මණ්ඩලය උපදේශක මණ්ඩලයක් ලෙස ක්‍රියා නොකරයි.
   (5) රාජ්‍ය නායකයාගේ භූමිකාව ජනාධිපති නිලය වෙතට ගොනුකර නැත. (.........)

**13. මතවාදයක් ලෙස සමාජවාදයට අදාල වන්නේ,**
(1) 19 වන සියවසේ ආසියාවේ මතුවූ දේශපාලන මතයකි
(2) සමාජවාදය මතුවන අවධි පැහැදිලි ලෙස හඳුනාගත නොහැක
(3) කාල්මාක්ස් හා ෆෙඩ්රික් එංගල්ස් මනෝරාජික සමාජවාදයේ පුරෝගාමින්ය.
(4) සමාජවාදය ධනවාදය නිෂේධ කිරීමේ මතවාදයයි.
(5) අදවනවිට ලොවපුරා බහුලව භාවිතාවන දේශපාලන මතවාදයකි. (.........)

**14. ගැටුම් සමථන ක්‍රියාවලියට අදාල වන්නේ,**
(1) ගැටුම් සමථනය කෙටිකාලින වෙයි
(2) ගැටුමට සාධනීය ලෙස පිවිසෙන මාධ්‍යන් නොපවතී
(3) ගැටුම් පරිවර්තනය සමතනයට අදාල නැත
(4) ගැටුම් සමතන මාධ්‍ය පැහැදිලිව හඳුනා ගත හැක
(5) සහමන්ත්‍රණය සිදු කරන ආකාර තුනක් පවතී (.........)

**15. ප්‍රතිසන්ධානගතවීමට අදාල වන්නේ,**
(1) සාමය ගොඩනැංවීමේ න්‍යාය පත්‍රයේ ප්‍රතිසංධාන ගතවීමට වැදගත් ස්ථානයක් හිමි නොවේ.
(2) සංහිඳියාව ඇති කිරීම යන්න මෙයට අදාල කරගත නොහැක.
(3) ප්‍රතිසංධානගත වීම යන්නෙහි සරල අර්ථය වන්නේ අතීතයේ ගැටුමට සම්බන්ධ සියළු පාර්ශව මෙන්ම ගැටුම තුල බෙදී සිටි ජනතාව ද සාමය ගොඩනැගීම සඳහා එකතු වීමය.
(4) ප්‍රතිසංධානගතවීම අදවන විට දැඩිලෙස විවේචනයට ලක්වී ඇත.
(5) ප්‍රතිසංධානගත වීමෙහි විවිධ අවධි දක්නට නොලැබෙයි. (.........)

**16. යටත්විජිත රාජ්‍ය යන සංකල්පයට නොගැළපෙන ප්‍රකාශය තෝරන්න,**
(1) විජිතකාරක රාජ්‍ය හා යටත් විජිතය අතර සම්බන්ධය විග්‍රහ කිරීමට යොදා ගැනෙන දේශපාලන විද්‍යා සංකල්පයකි.
(2) ඉටු කරන්නේ විජිත කාරක රාජ්‍යයේ නියෝජිත කාර්යයි
(3) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණවලින් යුක්තය.
(4) විජිත පාලනයටජනතාවගෙන් ලැබෙන්නේ අවම සුජාත භාවයකි
(5) විජිත රාජ්‍යයේ ආර්ථික සමෘද්ධියට දායක වෙයි (.........)

**17. කොල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනාවක් නොවූයේ,**
(1) වෙළෙඳ ඒකාධිකාරය අහෝසිකිරීමයි
(2) රාජකාරික්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමය
(3) රාජ්‍ය සේවයට ඇතුලත්වීමට ලාංකිකයින්ට අවකාශ සැලසීමය
(4) පැවති ද්විත්ව පාලනය අහෝසි කිරීමය.
(5) ආණ්ඩුකාරවරයාගේ අසහාය බලතල අඩු කිරීමය (.........)

**18. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයක් නොවන්නේ,**
(1) ව්‍යවස්ථාව ලිඛිත වීමය
(2) සාපේක්ෂ වශයෙන් අනම්‍ය ව්‍යවස්තාවක් වීමය
(3) ව්‍යවස්ථාදායකය ඒකමණ්ඩලික වීමය.
(4) ලංකා සමාජය බහු ආගමික හා බහු වාර්ගික බව පිළිගැනීම.
(5) ස්වාධීන අධිකරණ සේවයක් හා රාජ්‍යසේවයක් ඇති කිරීමයි (.........)

**19. ඉන්දියානු සන්ධීය ක්‍රමයේ විශේෂ ලක්ෂණයක් වන්නේ,**
(1) ඉන්දියානු රාජ්‍යයේ ඇති සන්ධීයත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සෘජුවම ප්‍රකාශ කරයි.
(2) ව්‍යවස්ථාවමඟින් ප්‍රාන්ත ස්ථාපිතකොට එමඟින්ම ප්‍රාන්ත හා මධ්‍යම ආණ්ඩුව අතර බලය බෙදා ඇත.
(3) ව්‍යවස්ථාව නිර්මාණය කරණ විට එහි ඒකීය ලක්ෂණ මතුකර නැත.
(4) ප්‍රාන්ත විසුරුවා හැරීමට මධ්‍යම රජය බලය නැත.
(5) වර්තමාන ඉන්දියාවේ ෆෙඩරල් ලක්ෂණ ශක්තිමත් වී නැත (.........)

20. **1978 ව්‍යවස්ථාවෙහි 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙහි ප්‍රධාන අරමුණු වූයේ,**

(1) 18 වන සංශෝධනය මුළුමනින්ම අහෝසි කිරීම.

(2) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය වඩා ප්‍රජාතන්ත්‍රීකරණයකට ලක් කිරීම..

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීමය.

(4) ජනාධිපතිවරයාගේ ධුරකාලය වසර 05 දක්වා අඩු කිරීම ය.

(5) අග්‍රාමාත්‍යවරයාගේ බලය වැඩි කිරීමය. (.........)

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශය හෝ ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න**

21. **රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමය,**

A - ප්‍රතිපත්ති ක්‍රියාදාමය අවධි කිහිපයකින් සමන්විත චක්‍රයකි.

B - ප්‍රතිපත්ති ක්‍රියාදාමය චක්‍රයක් ලෙස දැක්වීම සංකීර්ණ ක්‍රියාවලියක් සරල කර දැක්වීමකි

C - ප්‍රතිපත්ති සම්පාදනය යනු අතීත ගැටලුවක් නිරාකරණය පිණිස හෝ අනාගත අහිතකර තත්වයක් වළකාලනු පිණිස හෝ නීති පැනවීමයි.

D - ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම යනු පනත් කෙටුම්පතක් නීතියක් බවට පත්වීමෙන් පසු සිදුවන දෙයයි.

E - ප්‍රතිපත්ති ඇවර කිරීම යනු යල්පැන නොගිය ප්‍රතිපත්ති අතහැර දැමීමය.

(1) ABC (2) CDE (3) ABCD (4) BCA (5) ADE (.........)

22. **1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වර්තමාන ව්‍යවස්ථාධායකය,**

A - වර්තමාන පාර්ලිමේන්තුවෙහි ජනාධිපතිවරයා කොටසක් නොවේ.

B - මෙය ඒක මාණ්ඩලික වන අතර නිලකාලය වසර 5කි.

C - වර්තමාන පාර්ලිමේන්තුව පළමුවර රැස් වී වසරක් ගිය පසු ඕනෑම වෙලාවක විසිරුවා හැරීමට ජනපතිට බලය ඇත.

D - පාර්ලිමේන්තුවේ මුලසුන දරන්නේ කථානායකවරයාය.

E - පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වීම සඳහා තිබිය යුතු ගණ පූර්ණය 45කි.

(1) ABD (2) BCD (3) ABC (4) CDA (5) ADCD (.........)

23. **විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීමේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටලුව වන්නේ,**

A - භෞතික වශයෙන් කුඩා රාජ්‍යයක් වීමයි

B - ආර්ථික හා ජාතික බලය සීමිත වීමය

C - කලාපීය බලවතෙකු අබිමුව සිටිම.

D - මහ බලවතුන් අතර අවි තරඟය කළමනාකරණය කිරීමය .

E - පොදු අභිමතයෙන් යුත් ජාතික මතවාදයක් නොපැවතීමය.

(1) ACD (2)BCD (3)AEC (4) AB (5) ABCE (.........)

24. **ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක පැවැත්මට,**

A - විසිවන සියවසේ මුල්භාගයේ සිට ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායක් පැවතීම හේතුවී ඇත.

B - 1931 සිට භුක්තිවිඳි සර්වජන ඡන්ද බල බාධාවක් වී තිබේ.

C - මධ්‍යගත පාලන ක්‍රමය දායක වී ඇත

D - ව්‍යවස්ථානුකූල ආණ්ඩුකරණය පිළිබඳ මහජන විශ්වාසය තිබීම හේතු වී ඇත.

E - ප්‍රජාතන්ත්‍රවාදී නොවන විකල්ප කෙරෙහි ඇති මහජන අභිරුචිය හේතු වී ඇතග

( 1) A පමණි (2)A හා B පමණි (3) C පමණි (4) A හා D ය (5)E පමණි (.........)

25. **බලතල බෙදීම සම්බන්ධයෙන් අදාල වන්නේ,**

A - බලතල බෙදීම නැතහොත් වෙන් කිරීම පිළිබඳ පැහැදිලි න්‍යායක් ඉදිරිපත් කළේ ප්‍රංශ විප්ලවයට කලින් ජීවත් වූ මොන්ටෙස්කියු විසිනි.

B - සංකල්පයක් වශයෙන් බලතල වෙන් කිරීමේ න්‍යායෙන් ඉදිරිපත් වූ එක් තර්කයක් වූයේ ආණ්ඩු බලතල කේන්ද්‍රගතව පවතිනතැන නිදහසට ඇති අවස්ථාව අඩු බවයි.

C - බලතල බෙදීම ප්‍රජාතන්ත්‍රවාදය අභියෝග යට ලක් කරයි .

D - බලතල බෙදීමේ න්‍යායට එල්ලවන තවත් විවේචනයක් නම් වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුකරණ ක්‍රියාවලියේ දි පාලනයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා මෙම ආයතන අතර හුදකලා බවක් හෝ වෙන්වීමක් හෝ නොව සහයෝගිත්වයක් තිබිය යුතු බවයි

E - ඇමරිකානු ආණ්ඩුක්‍රමය මෙම න්‍යාය ප්‍රතික්ෂේප කරයි

(1) ABD (2) CD (3) BD (4) ACE (5)BDC (.........)

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දි ඇති ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දි ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළව දි ඇති යෙදුම් යුගලය සම්බන්ධයෙන් 1 වගුව සඳහාවන යොමුවේ සඳහන් 1,2,3,4,5 යන වරණවලින් සුදුසු වරණය තෝරා එහි අංකය වරහන්තුළ ඇති තිත්ඉර මත ලියන්න.**

| අංකය | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍යය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි |

| ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|
| **26.** 1978 ආණ්ඩුක්‍රමයේ දේශපාලන විධායකය ද්විත්ව ස්වභාවයක් ගනි. | අගමැතිගේ ඉල්ලීම් ප්‍රකාරව පාර්ලිමේන්තුව විසිරීමට ජනපතිට හැකියාව ඇත. (............) |
| **27.** ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලයක් පැවති අධිපති ද්විත්ව පක්ෂ ක්‍රමය අද වන විට අභියෝගයට ලක්වී ඇත. | ශ්‍රී ලංකාවේ මහජනයා ජනවාර්ගික පක්ෂ ප්‍රතික්ෂේප කරයි. (............) |
| **28.** 1978 ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන කාලය තුල ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව ඇති වාර්තාව මිශ්‍ර හා සංකීර්ණ එකකි. | දේශපාලන මැදිහත්වීම් නිසා සාම්ප්‍රදායික වශයෙන් ස්වාධීන හා නිර්භිත ආයතන යක්ව පැවති අධිකරණයේ ගෞරවයට හානි පැමිණි අවස්ථා තිබේ. (............) |
| **29.** 1978 ව්‍යවස්ථාවෙන් ජනතා පරමාධිපත්‍යයේ ප්‍රකාශයන් ලෙස මූලික අයිතීන් වලට එතරම් වැදගත් කමක් ලබා දී නැත | ජාතික ආරක්ෂාවට අභියෝගයක් වන අයිතීන් ද හඳුන්වාදී තිබීම මෙහි විශේෂත්වයකි. (............) |
| **30.** 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා හා මධ්‍යම ආණ්ඩුව අතර දේශපාලන බලය බෙදා ඇත | 154 උ(1) වගන්තියට අනුව පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති කවර හෝ කරුණක් සම්බන්ධයෙන් නීති සම්පාදනයට පළාත් සභාවකට බලය නැත (............) |

## B කොටස

31. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම යන්නට වැදගත් තේමා දෙකක් ඇතුලත් ය. ඒවා මොනවා ද?
    I. ..........
    II. ..........
32. දර්ශනවාදී ප්‍රවේශයේ මූලික ලක්ෂණ 3 කි. ඉන් දෙකක් ලියන්න
    I. ..........
    II. ..........
33. දේශපාලන පක්ෂවල කාර්යභාරය තහවුරු වීමට බලපාන ලද කරුණු දෙකකි. ඒවා මොනවා ද?
    I. ..........
    II. ..........
34. නියෝජන ආණ්ඩුක්‍රමයේ ක්‍රියාත්මකවීම සඳහා අවශ්‍ය මූලික සමාජ විචල්‍යයන් 2 ලියන්න
    I. ..........
    II. ..........
35. වර්තමානයේදී රාජ්‍ය හා පුරවැසියා අතර සම්බන්ධතාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකකි. ඒවා මොනවාද?
    I. ..........
    II. ..........
36. ලිබරල් වාදයේ ප්‍රභේදයන් 3කි. ඉන් දෙකක් ලියන්න
    I. ..........
    II. ..........
37. ඒකීය ආණ්ඩුක්‍රමයේ ප්‍රවණතාවන් 3 කි. ඉන් දෙකක් ලියන්න.
    I. ..........
    II. ..........
38. ජාතික මතවාදයක් මෙන්ම දේශපාලන ව්‍යාපාරයන් ලෙස ජාතික වාදයේ ස්වරූප දෙකකි. ඒවා මොනවාද?
    I. ..........
    II. ..........
39. ගැටුම්වල කාර්ය පිළිබඳව ප්‍රධාන ප්‍රවේශයන් දෙකකි. ඒවා මොනවා ද?
    I. ..........
    II. ..........
40. යටත් විජිත රාජ්‍ය ලංකාවේ හඳුන්වාදුන් ප්‍රතිපත්තීන්ගේ බලපෑම ආකාර දෙකකි. ඒවා මොනවා ද?
    I. ..........
    II. ..........
41. සෝල්බරි පාර්ලිමේන්තුව බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙන් වෙනස්වීමට බලපාන ලද හේතු කිහිපයකි. ඉන් දෙකක් ලියන්න
    I. ..........
    II. ..........
42. නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුල ජනතා නියෝජිතයින් තෝරාපත්කර ගැනීම සඳහා භාවිතයට ගැනෙන මැතිවරණ ක්‍රම දෙකකි. ඒවා මොනවා ද?
    I. ..........
    II. ..........
43. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යටතේ ඵලදායී ලෙසින් පුරවැසි සහභාගිත්වය හා වගකීම් සහතික කිරීම සඳහා මැතිවරණ ක්‍රමය මඟින් ආරක්ෂා කළ යුතු මූලික නිර්ණායක කිහිපයකි. ඉන් දෙකක් ලියන්න
    I. ..........
    II. ..........
44. ආණ්ඩුවේ වගකීම පිළිබඳ මාන දෙකක් පවතී. ඒවා මොනවා ද?
    I. ..........
    II. ..........

45. රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කරණ හැදෑරීම් ආකාර දෙකකි. ඒවා මොනවා ද?

I. ..............................................................................................................................................

II. ..............................................................................................................................................

46. අධිකරණයේ ස්වාධීනත්වය පාර්ශව 3 ක සහභාගීත්වයෙන් ආරක්ෂා කළ යුතු මූලධර්මයකි. ඉන් දෙකක් ලියන්න.

I. ..............................................................................................................................................

II. ..............................................................................................................................................

47. ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා තෝරාපත් කරනමැතිවරණ ක්‍රමය (STV) මඟින් ව්‍යවස්ථා සම්පාදකයින් අපේක්ෂා කළ අරමුණු දෙකකි. ඒවා මොනවා ද?

I. ..............................................................................................................................................

II. ..............................................................................................................................................

48. 18 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් ඇතිකරණ ලද වෙනස්කම් දෙකක් ලියන්න

I. ..............................................................................................................................................

II. ..............................................................................................................................................

49. ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාදරයින් වර්ග දෙකකි. ඒ මොනවා ද?

I. ..............................................................................................................................................

II. ..............................................................................................................................................

50. නූතන රාජ්‍ය විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා වූ ක්‍රමවේ ද කිහිපයකි. ඉන් දෙකක් ලියන්න

I. ..............................................................................................................................................

II. ..............................................................................................................................................

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020

General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

දේශපාලන විද්‍යාව II
Political Science II

23 | S | II

කාලය : පැය දෙකයි
Time : Two hours

**සැලකිය යුතුයි.**

- **මෙම ප්‍රශ්න පත්‍ර 3කින් සමන්විතය.**
- **පළමු වැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක් ද දෙවැනි කොටසින් යටත් පිරිසෙන් ප්‍රශ්න දෙකක් ද තෙවැනි කොටසින් යටත් පිරිසෙන් ප්‍රශ්න එකක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු ලියන්න.**

## I කොටස

1) දේශපාලන අධ්‍යයන පැතිකඩ සාකච්ජා කරන්න (ලකුණු 20)

2) දේශපාලන අධ්‍යයනය කිරීම සඳහා ඇති පහත සඳහන් ප්‍රවේශවලින් ඕනෑම දෙකක් විස්තර කරන්න.
   I. දාර්ශනික ප්‍රතිමාණීය ප්‍රවේශය
   II. දේශපාලන අර්ථශාස්ත්‍රීය ප්‍රවේශය
   III. විද්‍යාත්මක (චර්යාවාදි ) ප්‍රවේශය (10 x 2 = 20)

3) පහත මාතෘකාවලින් ඕනෑම දෙකක් පිළිබඳව සාකච්ජා කරන්න.
   I. ගෝලීයකරණය රාජ්‍ය කෙරෙහි ඇති කරන බලපෑම
   II. රාජ්‍ය හා එහි භූමිකාව
   III. යටත් විජිත රාජ්‍ය
   IV. ඒකීය ආණ්ඩුක්‍රමය හා එහි ලක්ෂණ (10 x 2 = 20)

## II කොටස

4) ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනයේ ආර්ථික හා සමාජීය වෙනස්කම් පිළිබඳ විවරණයක් කරන්න (ලකුණ 20)

5) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ පෙන්වා දෙන්න. (ලකුණ 20)

6) පහත මාතෘකාවලින් ඕනෑම දෙකක් පිළිබඳව සන්සන්දනය කරන්න
   I. 1947 හා 1972 රාජ්‍ය සේවය හා එහි ස්වාධීනතාවය සඳහා ගෙන තිබෙන විධිවිධාන
   II. 1947 හා 1972 අධිකරණ හා එහි ස්වාධීනතාවය සඳහා ගෙන තිබූ විධිවිධාන
   III. 1947 සුළුජන අයිතීන් හා 1972 මානව අයිතීන් ආරක්ෂාව සම්බන්ධයෙන් ගෙන තිබූ විධිවිධාන
   IV. 1947 ව්‍යවස්ථාදායකයේ හා 1972 ව්‍යවස්ථාදායකයේ සංයුතිය කාර්ය හා බලතල (10 x 2 = 20)

7) 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා අදාල සංශෝධනයට අදාලව පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳව විමසන්න

I. අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ න්‍යාය හා භාවිතය
II. ජනාධිපති හා අගමැති අතර සහහැසිරීම
III. ඔම්බුඩ්ස්මන්ධුරය
V. ජනමත විචාරණය (10 x 2 = 20)

## III කොටස

8) ඇමරිකානු මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල විග්‍රහ කරන්න
(ලකුණු 20)

9) රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීමේ පසුබිම හා ප්‍රතිපත්ති ක්‍රියාදාමය සාකච්ජා කරන්න (ලකුණු 20 )

10) පහත මාතෘකාවලින් 2ක් පිළිබඳව විමසන්න

I. ස්ත්‍රිවාදය
II. ජාතිකවාදය
III. ගැටුම් වර්ගිකරණය
IV. 19 වන ව්‍යවස්ථා සංශෝධනය
V. ශ්‍රි ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ආරම්භය හා විකාශනය මෙන්ම මෑතකාලින ප්‍රවණතා
(10 x 2 = 20)